

# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ජාලයකින් සහ 3,000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත විශිෂ්ඨ නායකත්ව හැකියාවකින් යුත් පළපුරුදු වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රධාන අභ්‍යන්තර විගණක

**ප්‍රධාන අවශ්‍යතා**

- ➢ අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තිමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
  - I. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
  - II. එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
  - III. එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය
  - IV. සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය එක්සත් රාජධානිය/ ශ්‍රී ලංකාව හෝ වෙනත් සමාන වෘත්තීය සුදුසුකම්
- ➢ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (ප්‍රධාන කළමනාකාර සහ ඉන් ඉහළ, එයින් වසර 05ක් සහකාර සාමාන්‍යාධිකාරී හෝ ඉන් ඉහළ) වසර 08ක පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, ඉන් වසර 05ක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව පළපුරුද්ද තිබිය යුතුය
- ➢ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විගණන ක්‍රමවේද පිළිබඳ මනා දැනුම හා පළපුරුද්ද තිබිය යුතුය.
- ➢ පිරිස් කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අන්තර් ක්‍රියාකාරීත්වයන් පිළිබඳ තහවුරු කළ හැකි වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- ➢ බැංකු ක්ෂේත්‍රයේ ආයතනික යහපාලන භාවිතයන් සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ දැනුම සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) භාවිතය පිළිබඳ දැනුම සහිත වීම.
- ➢ වයස අවු. 56 ට වඩා අඩු වීම.

## ප්‍රධාන අවදානම් නිලධාරී

**ප්‍රධාන අවශ්‍යතා**

- ➢ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ බැංකුකරණය පිළිබඳ වෘත්තීමය සුදුසුකමක් ලබා තිබීම.
- ➢ ICASL/ICA (England and Wales)/ACCA (UK/CMA(UK)/(SL) යන එක් වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.
- ➢ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 08ක පළපුරුද්දක් (ප්‍රධාන කළමනාකාර සහ ඉන් ඉහළ, එයින් වසර 05ක් සහකාර සාමාන්‍යාධිකාරී හෝ ඉන් ඉහළ) ඉන් වසර 03ක් බැංකු හා මූල්‍ය ආයතනයක අවදානම් /මූල්‍ය/ විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
- ➢ ණය ඇගයීම සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම සහ ඇති හැකියාව වාසිදායක වනු ඇත.
- ➢ වයස අවු. 56 ට වඩා අඩු වීම.

**සේවා කොන්දේසි**

වසර 03 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන වාර්ෂිකව කාර්යසාධනය ඇගයීම සිදු කෙරෙන මෙම තනතුරු, ආයතනික කළමනාකාරීත්ව (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ශ්‍රේණියට සම) තනතුරු වේ.

**වැටුප් පරිමාව**

තෝරාගන්නා ලද අයදුම්කරුවන් සුදුසුකම් සහ පළපුරුද්ද මත, සාකච්ඡා කර ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ඇත.

**අයදුම් කළ යුතු ආකාරය**

තමා පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිතව තම ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024 සැප්තැම්බර් 03 දින හෝ ඊට පෙර careers@rdb.lk ඊමේල් ලිපිනයට යොමු කරන්න. එහි විෂය (Subject) තීරයේ අයදුම්කරනු ලබන අදාළ තනතුර සඳහන් කරන්න.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවා ගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank


ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk